කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය (නව/පැරණි නිර්දේශය)

බෞද්ධ සමාජ චින්තාව - පුද සිරිත් හා උත්සව BUCU– E 2025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ විග්‍රහයේ සුවිශේෂත්වය අදාළ මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

02. බෞද්ධ ඉගැන්වීම් තුළින් අවධාරණය වන පුද්ගල ස්වාධීනත්වය පිළිබඳ විමර්ශනයක් කරන්න.

03. ශක්තිමත් අන්තර් පුද්ගල සබඳතාවක් ගොඩ නැගීම විෂයෙහි අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ ඇති වැදගත්කම බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විශද කරන්න.

04. ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළින් ප්‍රකට වන පුද්ගල හා සමාජ සුබසාධනය ගෙනහැර දක්වන්න.

05. සමෘද්ධිමත් රාජ්‍යයක් ගොඩ නැගීමෙහි ලා දූරදර්ශී රාජ්‍ය පාලනයක ඇති අවශ්‍යතාව රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ විග්‍රහයන් ඇසුරින් පැහැදිලි කරන්න.

06. "නීතිය හා දඬුවම පුද්ගලයා වරදින් මුදවා ඔහු තුළ යහපත පිළිබඳ අවබෝධය ගොඩ නැංවීම අරමුණු කර ගත්තක් විය යුතුය." බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් තහවුරු කරන්න.

07. අන්‍යාගමිකයන් සමග බුදුරදුන් සහජීවනයෙන් ක්‍රියා කළ අයුරු සැකෙවින් දක්වා බහු ආගමික සමාජයකට ආගමික සහජීවනයේ ඇති අවශ්‍යතාව සනාථ කරන්න.

08. පිරිත් දේශනය කායික හා මානසික සුවතාව ගොඩ නැගීම විෂයෙහි ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.

09. ශ්‍රී ලාංකේය ගැමි ශාන්තිකර්ම තුළ දක්නට ලැබෙන බෞද්ධාගමික ආභාසය පිළිබඳ විමසීමක් කරන්න.

10. ආරාම කේන්ද්‍රීය පූජෝත්සවයන්හි අරමුණු හා පරමාර්ථ පහදා ඒවා සාක්ෂාත් කර ගැනීම විෂයෙහි වර්තමානයේ ඇති අවධිකම පහදන්න.

***********************************